# අයිඩියල් මෝටර්ස් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පළමු ඉලෙක්ට්‍රික් මෝටර් රථය හඳුන්වා දෙයි

අයිඩියල් මෝටර්ස් විසින් 'Ideal Moksha' නමින්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පළමු පූර්ණ ඉලෙක්ට්‍රික් මෝටර් රථය වෙළඳපොළට හඳුන්වා දීම 2022 ජූලි 28 ජයික් හිල්ටන් හෝටල් පරිශ්‍රයේදී සිදු කෙරිණ.

ලෝකය පුරා ඉහළ ජනප්‍රියත්වයක් දිනූ ඔස්ටින් මිනි මොක් රථයෙන් ආභාසය ලබා නිපදවනු ලැබූ Ideal Moksha ශ්‍රී ලංකාවේ මෝටර් රථ වෙළඳපොළ තුළ පෙරළියක් ඇති කරන්නට සමත් මෝටර් රථයකි. එමෙන්ම, වර්තමානයේ පවතින ප්‍රවාහන ගැටලුවට වඩාත් තිරසාර සහ පරිසර හිතකාමී විසඳුමක් ලෙසින්ද මෙය හඳුන්වා දිය හැකිය. උසස්ම තාක්ෂණය සහ නිර්මාණ සංකල්ප භාවිතය සමඟින් වඩාත් තෘප්තිමත් රිය පැදවීමේ අත්දැකීමක් ලබා දෙන නිසාම මෙම රථයට 'Moksha' යන නම යොදා ඇත. ශ්‍රී ලංකාවේ මාර්ගවලටත් හොඳින්ම ගැළපෙන මෙම මෝටර් රථය පෙනුම, ඉඩකඩ, සුවපහසුව සහ සම්බන්ධතාව අතින් ද කැපී පෙනෙයි.
රෝද හතරේ ඉලෙක්ට්‍රික් කොඩ්‍රිසයිකල් වාහන මාදිලියට අයත් වන Ideal Moksha මෝටර් රථය 22.46 kWh ලිතියම් බැටරියකින් සමන්විත වේ. ඇම්පියර් 15 ගෘහස්ථ විදුලි පේනුවකට සම්බන්ධ කර පැය කිහිපයකින් ආරෝපණය කිරීමේ හැකියාව ඇති අතර එක් ආරෝපණයකින් කිලෝමීටර් 200ක් දක්වා දුරක් ගමන් කිරීමේ හැකියාවද ඇත. කිලෝග්‍රෑම් 870ක බරින් යුතු මෙය 1080 rpm වේගයකින් ද සමන්විතය. වඩාත් ඉඩකඩ සහිත වාහනයක් වූ මෙහි රියදුරු සහ තවත් මගීන් 3 දෙනෙකුට සුවපහසුවෙන් ගමන් කළ හැකිය. මෙහි පිටත පෙනුම ද්වි වර්ණ සංකලනයකින් යුක්තය. Apple CarPlay සහ Android Auto යෙදවුම් භාවිත කළ හැකි අඟල් 7ක මල්ටිමීඩියා ස්පර්ෂ තිරයකින්ද සමන්විත නිසා පාරිභෝගිකයන්ට තමන් ප්‍රියකරන ගීත, තොරතුරු හෝ සිතියම් වැනි දෑ සඳහා පහසුවෙන් පිවිසීමේ හැකියාව පවතී. පූර්ණ වායුසමනය කළ මෝටර් රථයක් වන මෙහි push start සහ ඇලෝයි වීල් වැනි විශේෂාංගද ඇතුළත් වේ. එමෙන්ම, Ideal Moksha රථයේ ඉලෙක්ට්‍රික් මෝටරය සඳහා වසර 2ක පූර්ණ වගකීමක් සහ බැටරියට මිලදී ගත් දින සිට වසර 5ක් දක්වා වගකීමක් හිමි වේ. දිවයින පුරා පිහිටි අපගේ අලෙවි ජාලය හරහා අසමසම සේවාවන් ලබා ගැනීමේ හැකියාව ද ඇත. ඕනෑම සමාජ තරාතිරමක අයෙකුට දැරිය හැකි මිලකට ලබා ගත හැකි ඉලෙක්ට්‍රික් මෝටර් රථයක් වන Ideal Moksha ශ්‍රී ලංකාවේ ගෘහස්ථ භාවිතය සඳහා වඩාත් හොඳින් ගැලපේ. මිලියන 1.5ක් ලියාපදිංචි ත්‍රිරෝද රථ සහ මිලියන 4.5ක් ලියාපදිංචි මෝටර් සයිකල් භාවිතා වන ශ්‍රී ලංකාව වැනි රටකට මෙය පිරිමැසුම්දායී මෙන්ම ආරක්ෂාකාරී, ස්මාර්ට් ප්‍රවාහන විසඳුමකි. පූර්ණ ස්වයංක්‍රීය මෝටර් රථයක් වන මෙහි ගියර් මාරුවක් නොමැතිව ආරම්භයේ සිටම 100%ක ව්‍යාවර්ථයක් ලබා දෙයි. පහසුවෙන් අවබෝධ කරගැනීමටත් සුවපහසු රියදුරු අත්දැකීමක් විඳගැනීමටත් Ideal Moksha ඔබට ඉඩකඩ සලසයි. ඉන්ධන අවශ්‍යතාවක් නොමැති නිසා ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් පවතින ලොකුම හිසරදයකින් මිදීමටද පාරිභෝගිකයාට හැකිවේ. මේ සියලු සංකලනයන් සමඟ ඔබ වෙත පැමිණි Ideal Moksha, ශ්‍රී ලංකාවේ ගමන්බිමන් සංස්කෘතියට නව ප්‍රවේශයක් ලබා දෙන බවට සැක නැත. මෝටර් රථයක් ගැන සිහින දකින සාමාන්‍ය පුද්ගලයාගේ සිට වෙළෙඳ ක්ෂේත්‍රයේ විධායක නිලධාරියෙකු දක්වා පරාසයක ඕනෑම අයෙකුට ගැළපෙන මෝටර් රථයක් ලෙස ද Ideal Moksha අවිවාදයෙන්ම හඳුන්වා දිය හැකිය.
තිරසර ප්‍රවාහන විසඳුම් සම්බන්ධයෙන් කැපී පෙනෙන භූමිකාවක් ඉටු කරන ප්‍රමුඛ පෙළේ

ව්‍යවසායකයෙකු වූ, අයිඩියල් සමූහයේ නිර්මාතෘ/සභාපති, නලින් වෙල්ගම මහතා සහ කාලගුණ විපර්යාස පිළිබඳ උනන්දුවක් දක්වන ප්‍රවීණයන් පිරිසකගේ මෙහෙයවීමෙන් Ideal Moksha නිර්මාණය විය. මෙහි සියලු නිෂ්පාදන කටයුතු සිදු කරන ලද්දේ අයිඩියල් සමාගමට අයත් රත්මලානේ පිහිටි හරිත වැඩබිම් පරිශ්‍රයේ දීය (මෙම වැඩබිම පූර්ණ වශයෙන් සූර්ය ශක්තියෙන් බලගන්වා ඇත). මේ පිළිබඳ අදහස් දක්වමින් නලීන් වෙල්ගම මහතා, "Ideal Moksha වෙළඳපොළට හඳුන්වා දීමත් සමඟ, ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රික් මෝටර් රථයක් නිපදවීමේ මගේ සිහිනය සැබෑ කරගන්නට අද දවසේ මට හැකියාව ලැබුනා. ප්‍රවේශ මට්ටමේ මොටර් රථයක් වන මෙහි, ලෝකයේ හොඳම මෝටර් රථ තාක්ෂණයන්ට අදාළ නව්‍ය විශේෂාංග ගණනාවක්ද ඇතුළත් කොට තිබෙනවා. මෙවැන්නක් මගේ මවු රටට හඳුන්වා දෙන්නට ලැබීම, මගේ 35 වසරක මෝටර් රථ ව්‍යාපාරික අත්දැකීම් අතර සුවිශේෂී සන්ධිස්ථානයක්. එමෙන්ම මෙය ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ඉලෙක්ට්‍රික් වාහන යුගයේ සමාරම්භය ද සනිටුහන් කරනවා" යනුවෙන් පැවසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ නලීන් වෙල්ගම මහතා, අපේ තවත් නිෂ්පාදන දෙකක් අද එළිදක්වා තිබෙනවා. ඉන් එකක් තමයි විදුලියෙන් ක්‍රියාත්මක ඉලෙක්ට්‍රික් මෝපඩ් රථය. ඒ එක්කම එන්ජිමක් සහිත ස්කුටර් එකක් අප ඉලෙක්ට්‍රික් එකක් බවට පරිවර්තනය කර තිබෙනවා. ඒක retrofit නමින් හඳුන්වා තිබෙනවා. ශ්‍රී ලංකාවේ නිවෙස් ලක්ෂ 55ක් තියෙනවා. එම නිවෙස්වලින් බහුතරයක් සාමාන්‍යයෙන් විදුලි ඒකක 100-200 පමණ ප්‍රමාණයක් තමයි භාවිතා කරන්නේ. එවැනි අයට තමයි විශේෂයෙන් මෝපඩ් රථය සහ විදුලියට පරිවර්තනය කළ ස්කූටරය හා Moksha මෝටර් රථය උචිත වෙන්නේ. ඒ අයට අපි සම්පූර්ණයෙන්ම විදුලි බිලෙන් නිදහස් විය හැකි පරිදි තමන්ගේ නිවෙස්වල සවිකර ගත හැකි සෝලා පද්ධතියක් ඳුන්වාදීමටත් කටයුතු කරනවා. එය පාරිභෝගිකයාට අවශ්‍ය ප්‍රමාණය තීරණය කිරීමෙන් පසු ඒ සෝලා පද්ධතිය තමන්ගේ නිවසේ වහලය මත සවිකර ගැනීමෙන් පසු ඔවුන්ගේ විදුලිබිල ශුන්‍ය කරගත හැකි වෙනවා. එමගින් ඔවුන්ගේ දෛනික ජීවිතයේ වැඩකටයුතු කර ගැනීම සහ වාහනයේ නඩත්තු කර ගැනීමට විශාල රුකුලක් වෙනවා යැයි කියා සිටියේය.

මෙය අයිඩියල් මෝටර්ස් සමාගමේ ඉදිරි ගමනේ එක් ආරම්භයක් පමණි. පූර්ණ ඉලෙක්ට්‍රික් මෝපඩ් සහ retrofit kit ඇතුළත් නිසා දහන එන්ජිම වෙනුවට ඉලෙක්ට්‍රික් එන්ජිමකින් මෙය සමන්විතය. Ideal Moksha සහ අනෙකුත් ඉලෙක්ට්‍රික් වාහන විසඳුමේ එක් කොටසක් පමණි. අයිඩියල් සමූහය හුදෙක්ම විදුලි පිරිවැය අවම කිරීමට කටයුතු කරන සමාගමක් පමණක් නොව තිරසර බලශක්ති මූලාශ්‍රයන් කෙරෙහි ද දැඩි උනන්දුවක් දක්වන සමාගමකි. ඒ අනුව අයිඩියල් සමූහය විසින් Ideal Moksha ලෙස පාරිභෝගික ඔබ වෙත ඉදිරිපත් කරන්නේ තිරසර බලශක්තිය යොදා නිපදවනු ලැබූ පූර්ණ හරිතවත් ප්‍රවාහන විසඳුමක් වන අතර, මාසිකව කිලෝවොට් 100 - 200 විදුලි ඒකක ප්‍රමාණයක් පරිභෝජනය කරනු ලබන, මිලියන 5.5ක ගෘහස්ථ පාරිභෝගික ප්‍රජාවක් මෙමඟින් ඉලක්ක කරනු ලබයි. වහල මත සවි කළ හැකි කිලෝවොට් 4ක සූර්ය පැනලයක් ද මෙම පැකේජයට ඇතුළත් නිසා සාමාන්‍ය පාරිභෝගිකයෙකුට තමන්ගේ දෛනික අවශ්‍යතා සඳහා විදුලිය වැය වීම ද අවම කරගැනීමට මෙමඟින් අවස්ථාව උදා වේ. අයිඩියල් සමූහය යනු එවැනි සංවිධිත, ඒකාබද්ධ චින්තන රටාවක් තුළින් ගැටලුවලට විසඳුම් ඉදිරිපත් කරන සමාගමකි. Ideal Moksha යනු එහි පළමු පියවරයි. නමුත් එය නිසැක අනාගත පෙරළියකට හේතුවනු නොඅනුමානයි.

අයිඩියල් ගැන බිඳක්

දශක 3ක් පුරා දේශීය රථවාහන ක්ෂේත්‍රයේ මෙන්ම පසු-විකුණුම් සේවා සැපයීම අතින් කැපී පෙනෙන මෙහෙවරක නිරත වන අයිඩියල් සමූහය යනු මෙරට ප්‍රමුඛතම සමාගම් අතර සිටින සැබෑම ශ්‍රී ලාංකික සමාගමකි. රු. බිලියන 25කට අධික වාර්ෂික පිරිවැටුමක් සහිත අයිඩියල් සමූහය 2000කට අධික සාමාජික පිරිසකින්ද සමන්විතය. වාහන එකලස් කිරීම, මෝටර් සහ ඉලෙක්ට්‍රික් වාහන ආනයනය සහ බෙදාහැරීම, ජෙනුයින් අමතර කොටස් අලෙවිය හා අලෙවියෙන් පසු සේවාවන්, ලුබ්‍රිකන්ට්, මූල්‍ය හා ලීසිං, බලශක්ති උත්පාදනය සහ තිරසර බලශක්තිය, මගී ප්‍රවාහන, දෙස් විදෙස් කුරියර් සේවාවන් ඇතුළු භාණ්ඩ ප්‍රවාහනය, කෘෂිකර්ම හා ඊ-වාණිජ ඇතුළු පුළුල් පරාසයක සේවාවන් රැසක් අයිඩිල් මෝටර්ස් වෙතින් සපයනු ලබයි.

මහේන්ද්‍රා මෝටර් රථ සඳහා ශ්‍රී ලංකාවේ එකම බලයලත් අලෙවි නියෝජිතයා සහ ඉන්දියාවේ මෝටර් රථ නිෂ්පාදනයේ දැවන්ත සමාගමක් වන ඒයසබාර් 'බා ඒයසබාර් සම හවුල්කාරීත්වයෙන් වැලිපැන්න ප්‍රදේශයේ ඉදිකළ ශ්‍රී ලංකාවේ ප්‍රථම වාහන එකලස් කිරීමේ හා නිෂ්පාදනය කිරීමේ අංගනයේ සම හිමිකාරීත්වය ද අයිඩියල් සමූහය විසින් උසුලනු ලබයි.